// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1950/9 - 2016 ජනවාරි මස 18 වැනි සඳුදා - 2016.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*අංක* : 4/3/1/128.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශ්‍යතාවයේ විස්තර :*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේලාපුර කළුතර ගමේ සර්වේයර් ජනරාල්ගේ අංක මු. පි. ක. 4545 දරන සැලැස්මේ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1335ක් වූ පහත සඳහන් බිම් කැබැල්ල.

**1. කැබලි අංක :01**

ඉඩමේ නම: මන්කට්ටවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 02ක් ඇත; හිමිකම් කියන අය: ප්‍රධාන කළමණාකරු (දේපල), ලංකා බැංකු මූලස්ථානය, කොළඹ 01; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1335.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 29 වැනි දින පූ. භා. 10.30 ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඉඩමට ඇති තම අයිතිය සනාථ කිරීම සඳහා අදාල ඔප්පු, ප්ලෑන් හා අනෙකුත් ලියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.

විමල් ගුණතුංග,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2016 ජනවාරි මස 13 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 33

---

ශුද්ධිපත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම සංශෝධනය

*යොමු අංකය*: 4/3/1/119/(iv) අතිරේක 3.

උක්ත කරුණට ආදාලව අංක 1927/27 හා 2015.08.11 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්පත්‍රයේ* පළකරන ලද අංක 08-727 දරන 7 වැනි වගන්තිය යටතේ සිංහල

භාෂාවෙන් පළකරන ලද දැන්වීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 4512 දරන මූලික පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0026ක් වූ ඉඩම පිහිටි ගම කළුතර උතුර ලෙස සඳහන් වීම දෝෂ සහගත වන අතර එය ‘‘නාගොඩ’’ ලෙස සංශෝධනය විය යුතුය.

විමල් ගුණතුංග,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2015 දෙසැම්බර් මස 31 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 34

---

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DIVKE/LND/LND2/ACQUT/5/3/3/3/4/2.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 3J/42E/326.

වර්ෂ 2013 ජුනි මස 21 වැනි දින අංක 1815/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමෙහි සඳහන් කැබලි අංක 01 සඳහා හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය හා වේලාව පහත සඳහන් පරිදි සංශෝධනය කළ යුතු බව මෙයින් දැනුම්දෙමි.

| *දිනය* | *කැබලි අංක* | *වේලාව* |
|---|---|---|
| 2016.02.01 | 01 | පෙ. ව. 10.00 |

තව ද 2016 ජනවාරි මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එල්. එස්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය/නැගෙනහිර

2016 ජනවාරි මස 13 වැනි දින,
කුලියාපිටිය/නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 35

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය*: KDS/KUN/04/07/16/04/51.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/9/2011/WS/132.

උක්ත ශීර්ෂය යටතේ 2015 ඔක්තෝබර් මස 22 වැනි දින ම විසින් අංක 1937/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 11—134 යටතේ පළ කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි, සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2015 දෙසැම්බර් 02 | 2016 පෙබරවාරි 17 |
| 2015 නොවැම්බර් 24 | 2016 පෙබරවාරි 09 |

එල්. ඒ. ඩී. ගීතා ඉන්ද්‍රානි,
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

2016 ජනවාරි මස 11 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

2 - 36

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය*: KDS/KUN/04/07/16/04/52
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/9/2011/WS/133

උක්ත ශීර්ෂය යටතේ 2015 ඔක්තෝබර් මස 22 වැනි දින ම විසින් අංක 1937/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* අංක 11—135 යටතේ පළ කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි, සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2015 දෙසැම්බර් 02 | 2016 පෙබරවාරි 17 |
| 2015 නොවැම්බර් 24 | 2016 පෙබරවාරි 09 |

එල්. ඒ. ඩී. ගීතා ඉන්ද්‍රානි,
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

2016 ජනවාරි මස 11 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

2 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.